# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2022 අංක 4 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2022 පෙබරවාරි මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 පෙබරවාරි මස 18 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. **9.00** **තැපැල් ගාස්තුව :** රු. **15.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2022 අංක 4 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 පෙබරවාරි මස 17 වන දින]

එල්. ඩී.–ඕ. 20/2020

### 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

**1.** මේ පනත 2022 අංක 4 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 5ඇ වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:– 1978 අංක 2 දරන පනතේ 5ඇ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"වාර්තාධිකාරී විනිශ්චයකාරවරයා පත් කිරීම

5ඇ. (1) අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරන යම් මහාධිකරණයකට වාර්තාධිකාරී විනිශ්චයකාරවරයකු පත් කිරීම අවශ්‍ය වන බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවක දී, එකී කොමිෂන් සභාව විසින් එකී මහාධිකරණය සඳහා වාර්තාධිකාරී විනිශ්චයකාරවරයා යනුවෙන් හඳුන්වනු ලබන අධිකරණ නිලධරයකු, දිසා විනිශ්චයකාරවරයන් සහ මහෙස්ත්‍රාත්වරයන් අතුරින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (මේ වගන්තියේ "නඩුව විභාග කරන විනිශ්චයකාරවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) එකී මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට යටත් ව, පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණවල දී මූලාසනය දැරීමේ බලය එකී මහාධිකරණය වෙත පත් කරන ලද වාර්තාධිකාරී විනිශ්චයකාරවරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(3) වාර්තාධිකාරී විනිශ්චයකාරවරයා විසින්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 195අ වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි, (2) වන උපවගන්තිය යටතේ ඔහු වෙත පවරනු ලබන පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණවලට සහ නඩුව විභාග කරන විනිශ්චයකාරවරයා විසින් ඔහු වෙත පවරනු ලබන අපරාධ නඩු කටයුත්තක දී උද්ගත විය හැකි, යම් චූදිතයකුට දණ්ඩන නියම කිරීම ඇතුළත් නොවන පශ්චාත් නඩු විභාග කාරණාවලට සහභාගි විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද අදියරෙන් පසුව, එම අධිකරණයේ පවරනු ලැබූ නඩු කටයුතු පවත්වාගෙන යාමේ දී උද්ගත වන කාර්ය පටිපාටිමය ස්වභාවයෙන් වූ යම් කාරණයක් නඩුව විභාග කරන විනිශ්චයකාරවරයා විසින් වාර්තාධිකාරී විනිශ්චයකාරවරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(5) වාර්තාධිකාරී විනිශ්චයකාරවරයා විසින්, ඔහු විසින් අන්‍යාකාරයකින් නිසි පරිදි කටයුතු කරනු ලැබ තිබිය හැකි යම් කාරණයක් තීරණය කරනු ලැබීම සඳහා නඩුව විභාග කරන විනිශ්චයකාරවරයා වෙත එම විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(6) (අ) වාර්තාධිකාරී විනිශ්චයකාරවරයා, වෙනම අසුන්ගත යුතු අතර, (3) වන උපවගන්තිය මගින් ඔහු වෙත පවරා ඇති සියලු බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය;

(ආ) අධිකරණයේ කාර්ය සටහන් පත්‍ර පවත්වාගෙන යාම ඇතුළුව (3) වන උපවගන්තියේ සඳහන් කර ඇති බලතල ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික හෝ අනුයාත සියලු ක්‍රියාවන් සිදු කිරීමේ බලය වාර්තාධිකාරී විනිශ්චයකාරවරයාට තිබිය යුතු ය; සහ

(ඇ) වාර්තාධිකාරී විනිශ්චයකාරවරයා විසින්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 195අ වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණවලට අදාළ බලතල ක්‍රියාත්මක කිරීම, මහාධිකරණය විසින් 9 වන වගන්තිය ප්‍රකාරව අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අවස්ථාවක ඒ පිළිබඳව වන කාරණා සම්බන්ධයෙන් පමණක් සිදු කළ යුතු අතර, මහාධිකරණය විසින් අභියාචන, ප්‍රතිශෝධන හෝ රිට් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට කැඳවනු ලබන අවස්ථාවක ඒ පිළිබඳව වන කාරණා සම්බන්ධයෙන් ඒ බලතල ක්‍රියාත්මක නොකළ යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.